(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 62.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 අප්‍රේල් මස 05 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

117/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.05.01 දින පුරප්පාඩු වූ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නිලධාරියෙකු පත්කළ ක්‍රමවේදය කවරේද;

(ii) උක්ත තනතුර දැරීමට සම්පූර්ණ කළ යුතු, අධ්‍යාපන හා රාජ්‍ය සේවයේ නියමිත මූලික සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2014.06.02 දින ඉහත තනතුරට තාවකාලික පදනමින් අනුයුක්ත කළ ඉන්ද්‍රාණි මංගලිකා වික්‍රමනායක යන නිලධාරිනියගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඇය 2003.03.03 දින සිට 2013.02.11 දින දක්වා නිත්‍ය රාජ්‍ය සේවයේ කෙතරම් කාලයක් සේවය කර තිබේද;

(v) වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීම සඳහා නිලධාරියකු පත් කළ යුත්තේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම නිලධාරිනියට එරෙහිව මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව මඟින් පරීක්ෂණයක් සිදු කරන බව දන්නේද;

(ii) එසේ නම්, එවැනි නිලධාරිනියකට අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් ලබාදීමේ නීත්‍යානුකූල පදනම කවරේද;

(iii) අදාළ පත්වීම බල රහිත කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

234/'15

2.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 ජනාධිපතිවරණය පාදක කරගනිමින් 2014 වසර අවසානයේ ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කිරීමෙන් පසුව රුපියල් කෝටි 6 1/2කට ආසන්න මුදලක් වැයකොට කොළඹ කැම්බල් පිටියේ පැවැත්වූ දිවි නැගුම දෙපාර්තමේන්තුවේ ජාතික සම්මේලනය තුළින් මහජන මුදල් අවභාවිතා කර තිබේද;

(ii) මෙම සම්මේලනය සඳහා රු. 63,723,574/-ක් වැය කිරීම සඳහා අනුමතිය ලබා දුන් බලධාරියා කවුරුන්ද; ඔහුට එවැනි අනුමතියක් ලබාදීමට බලය තිබේද;

(iii) සම්මේලනයක් සඳහා මෙතරම් විශාල මුදලක් වැය කිරීමේදී ටෙන්ඩර් පටිපාටීන් අනුගමනය කර තිබේද;

(iv) මෙම මුදල් අවභාවිතය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු මට්ටමින් යම් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(v) එසේ නම්, එම පරීක්ෂණයේ නිගමනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම මූල්‍ය අවභාවිතය සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් සිදු කරනු ලබන විමර්ශනයන්ගේ වත්මන් තත්ත්වය කවරේද;

(ii) දිවි නැගුම දෙපාර්තමේන්තුවට අහිමි වූ රුපියල් කෝටි 06කට අධික මුදල සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයින් කවුරුන්ද;

(iii) එම මුදල අයකර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

305/'15

3.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද රාජපක්ෂ පවුල සතුව ඩොලර් බිලියන 18ක් වටිනා විදේශ වත්කම් තිබෙන බවට විදේශ බුද්ධි අංශ අනාවරණය කරගෙන ඇති බවට විදේශ අමාත්‍යතුමා 2015 මැයි 7 දින මාධ්‍ය හමුවක දී ප්‍රකාශ කළ බව දන්නේද;

(ii) එකී තොරතුරු පොලිස් දෙපාර්තමේන්තුවට යොමු කළ දිනය කවරේද;

(iii) එම දේපළ උපයා ගත් ආකාරය පිළිබඳව මහින්ද රාජපක්ෂ මහතාගෙන් හෝ එම පවුලේ වෙනත් සාමාජිකයෙකුගෙන් ප්‍රශ්න කර තිබේද;

(iv) එකී දේපළ මෙතෙක් ශ්‍රී ලංකාවට ගෙන ඒමට පියවර නොගත්තේ මන්ද;

(v) එකී දේපළ ශ්‍රී ලංකාවට ගෙන ඒමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

348/'15

4.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය සමයේ කොටස් වෙළඳපොළ තුළ සිදු වූ වංචා හා දූෂණ මේ වනවිටත් සිදුවන්නේද;

(ii) එසේ නොවේ නම්, ඒ හරහා ලබාගත් ප්‍රගතිය කවරේද;

(iii) සිදුකර ඇති වංචා හා දූෂණ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන්නේද;

(iv) එසේ නම්, එම පරීක්ෂණවල වර්තමාන තත්ත්වය කවරේද;

(v) පරීක්ෂණවලින් වැරදිකරුවන් වන පුද්ගලයින්ට එරෙහිව නීතිමය පියවර ගැනීමේ වගකීම භාර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

413/'16

5.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 අගෝස්තු මස සිට ඇහැළියගොඩ ඡන්ද කොට්ඨාසයේ ගැබිනි මව්වරුන් සඳහා පෝෂණ මල්ල නොලැබෙන බවත්;

(ii) එයට හේතු විමසූ විට, ඒ සඳහා මුදල් නොලැබුණු බව අදාළ බලධාරීන් විසින් සමූපකාරය වෙත දන්වා ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) පෝෂණ මල්ල ලබාදීම සඳහා මුදල් ලබානොදීමට හේතු කවරේද;

(ii) හිඟයත් සමඟ නැවත පෝෂණ මලු ලබාදීමට නොපමාව පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

128/'15

6.

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අතීතයේ සිට පැවත එන දේශීය වී වර්ග වගා කිරීම සඳහා කෘෂි රසායන ද්‍රව්‍ය අවශ්‍ය නොවන බවත්;

(ii) දේශීය පැරණි වී ප්‍රභේද වගා කිරීමේදී අවම ජල ප්‍රමාණයක් අවශ්‍ය වන අතර පාරම්පරික ක්‍රම භාවිතයෙන් පරිසරයට හා මිනිසාට සිදුවන හානිය අවම බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට හඳුනාගෙන ඇති, ශ්‍රී ලංකාවේ භාවිතා කළ පැරණි වී වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම වී වර්ගයන්ගේ නම් කවරේද;

(iii) දැනට වගා කරන පැරණි වී වර්ග කවරේද;

(iv) අනෙකුත් පැරණි වී වර්ග වගා නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2014 වනවිට දේශීය පැරණි වී වර්ග, බීජ වී ලෙස යොදා ගෙන වගා කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාව පුරා එම බීජ වී ව්‍යාප්ත කිරීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

379/'15

7.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය මාස 03ක කාලය ඇතුළත විශේෂ කාර්ය බලකාය විසින් දෙහිවල-කවුඩාන ප්‍රදේශයේ මෙහෙයුමක් දියත් කරනු ලැබුවේද;

(ii) එම කාලය ඇතුළත දෙහිවල-කවුඩාන ප්‍රදේශයේ නිවසකින් මරාගෙන මැරෙන බෝම්බ සමඟ පුද්ගලයින් විශේෂ කාර්ය බලකාය මඟින් අත්අඩංගුවට ගෙන තිබේද;

(iii) එසේ නම්, ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඔවුන්ගෙන් හෙළිදරව් වූ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෙහිවල-කවුඩාන ප්‍රදේශයෙන් ISIS ත්‍රස්තවාදීන්ට සම්බන්ධ පුද්ගලයින් අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, ඔවුන් පිළිබඳව ගත් පියවර කවරේද;

(iii) එසේ නොමැති නම්, එසේ වූ බවට පවසන අය වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාව ISIS ත්‍රස්තවාදීන්ගේ ගොදුරක් හෝ සාමාජිකයන් බඳවා ගන්නා ස්ථානයක් බවට බුද්ධි අංශ විසින් හඳුනා ගෙන තිබේද;

(ii) එසේ නම්, එයින් මිදීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

394/'15

8.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 මුදල් වර්ෂය තුළදී,

(i) අපේක්ෂා කළ බදු සහ බදු නොවන ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සත්‍ය බදු සහ බදු නොවන ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සත්‍ය බදු සහ බදු නොවන ආදායම, අපේක්ෂිත බදු සහ බදු නොවන ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 ආදායම සමඟ සාපේක්ෂව සැසඳීමේදී, 2016 අපේක්ෂිත ආදායම කෙතරම් දුරට යථාර්ථවාදීද;

(ii) 2016 වියදම් ශීර්ෂ ආදායම සමඟ ගැලපීමේදී කපා හැරෙන වියදම් මොනවාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

400/'16

9.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර ගිවිසුම සහ ඒ අනුව සකස් කරන ලද 2011 මැයි සහ 2011 ඔක්තෝබර් ප්‍රතිස්ථානගත සැලසුම් අනුව, ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක හික්කඩුව, බද්දේගම, නිල්හේන (B158) මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියට වැය කළ මුළු මුදල කොපමණද;

(ii) හික්කඩුව, ගෝනපීනුවල සහ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල බලපෑමට ලක් වූ පුද්ගලයින් හෙවත් ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත පුද්ගලයින්ට වන්දි ගෙවීම් සටහන් කළ සියලුම ලාර්ක් තීන්ත සටහන් සභාගත කරන්නේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හික්කඩුව, ගෝනපීනුවල සහ බද්දෙගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා පත්කර ඇති 5 දෙනෙකුගෙන් යුත් දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුවේ (GRC) සාමාජිකයින්ගේ නම් සහ ඔවුන්ගේ තනතුරු කවරේද;

(ii) ඉඩම් අත්පත් කර ගැනීම, වන්දි ගෙවීම් හා ප්‍රතිස්ථාපනගත කිරීම් සම්බන්ධයෙන් ගැටලුවක්, පැමිණිල්ලක් හෝ මතභේදයක් විසඳා ගැනීම සඳහා බලපෑමට ලක්වූ පුද්ගලයින්හට එම කමිටුව හමුවට යා හැකිද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු එම්. එස්. තෞෆික් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1) — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

2.

ගරු එම්. එස්. තෞෆික් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2) — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"රිල්වානියියාහ් අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

3.

ගරු එම්. එස්. තෞෆික් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3) — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

4.

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 4) — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතන සංරක්ෂණ සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු මයන්ත දිසානායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 5) — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"1998 අංක 2 දරන ශ්‍රී ලංකා අභ්‍යන්තර සැලසුම්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග (අංක 1),— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග (අංක 2),— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,— 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජනවාරි 18 දිනැති අංක 1950/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ක්ෂුද්‍රමූල්‍ය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ කරන නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අගෝස්තු 6 දිනැති අංක 1926/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වැනි වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 18 දිනැති අංක 1954/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*11.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල ඇතුළත් 13 සහ 17 වැනි වගන්ති සංශෝධනය කරමින් 2015 නොවැම්බර් 9 දිනැති අංක 1940/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*13.

මුදල් අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 240— වැඩසටහන 2,—† 2016 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන හා 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය විසින් ලබාගන්නා ලද ණය මුදලකින් මාරු කරන ලද හෝ මුදලින් රුපියල් මිලියන පනස් පහක් නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු ය.

මෙහි උපලේඛනයේ දක්වා ඇති සේවාවන් වෙනුවෙන්

(අ) 2015 මුදල් වර්ෂය සඳහා හදිසි අවස්ථා අරමුදලින් ලබාගත් අත්තිකාරම් අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10 හා 11 පියවීම.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| ශීර්ෂය | 240 - | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | 2 - | සංවර්ධන වැඩසටහන |
| ව්‍යාපෘතිය | 3 - | ගිණුම්කරණ සහායන් |
| | | මුළු වියදම = රු. **55,000,000** |

(රුපියල් මිලියන පනස් පහක් පමණි.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2016 මාර්තු මස 24 වැනි දින ඉදිරිපත් කරන ලද 2016 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*14.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ රීති,— 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සාදන ලදුව, 2015 ජූලි 21 දිනැති අංක 1924/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.23 දින ඉදිරිපත් කරන ලද 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (බලපත්‍ර) රීති සහ 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමේ අදහස පිළිබඳ දැනුම් දීමේ) රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 28 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 16 (ඇ) වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 973 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***